**වැලිගම නගර සභාව - 2023**

**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වැලිගම නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වැලිගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම් ගත කර තිබූ රු.639,000 ක් වටිනා යන්ත්‍රෝපකරණ 6 ක් භෞතිකව නොතිබූ අතර එහි තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | අක්‍රීය ජංගම ගිණුම් දෙකක ශේෂ සනාථ සහතික අනුව ශේෂයන්ගේ එකතුව රු.4,514 ක් වුවද එය රු.119,417 ක අයිරාවක් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපාර ආයතන 32 කින් ලැබිය යුතු ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු රු.361,388 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර ආදායම් ශීර්ෂ 02 කින් ලැබිය යුතු ආදායම රු.459,021 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සභා බල ප්‍රදේශයේ මාර්ගයක් සංවර්ධනය සඳහා ගෙවිය යුතු රු.976,275 ක් වෙනුවෙන් ණයහිමි යටතේ ප්‍රතිපාදන ඇතුලත් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සභාව සතු විදුලි භාණ්ඩ හා රන් පොහොණිය ඉතිරි තොග වටිනාකම රු.836,873 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය විෂයයන් 16 ක ජර්නල් සටහන් වටිනාකම හා ලෙජර් ශේෂ වටිනාකම අතර රු.21,338,901 ක වෙනසක් හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 2 කට අදාල ශේෂයන් හා ඊට අදාල උපයෝගී ලේඛණ/උපලේඛණවල දැක්වෙන ශේෂ අතර රු.4,946,077 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවීමට කටයුතු කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.27,215,722 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ලේඛන යාවත්කාලීන කරන බව හා උපලේඛණ සොයා ගත නොහැකි බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මු.රෙ. 571 | වසර 2 ඉක්මවූ එකතු වටිනාකම රු.1,658,628 ක් වූ තැන්පතු ශේෂ 54 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මු.රෙ. 772(1) | භාවිතයෙන් ඉවත් කරන ලද අබලි භාණ්ඩ අයිතම 11 ක් හා විනාශ කළ යුතු භාණ්ඩ ඒකක 32 ක් විනාශ කිරීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අපහරණයට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2018 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2018 දරන වාහන කළමනාකරණ චක්‍රලේඛය | 2020 හා 2021 වර්ෂයේදී අපහරණය කරන ලද වාහන 02 ක ලියාපදිංචිය අවලංගු කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | වාහන අපහරණය කිරීමේදී ලියාපදිංචිය අවලංගු කර වාහන අපහරණය සිදු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,496,600 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.22,120,182 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දීර්ඝ කාලයක සිට අක්‍රීය තත්ත්වයේ පැවති රු.119,417 ක අයිරාවක් ලෙස දක්වා තිබූ බැංකු ගිණුම් 2 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වෙනසට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදු කිරීමෙන් පසු ශේෂයන් නිවැරදිව ගිණුම්ගත කරන බව. | අක්‍රීය බැංකු ගිණුම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 15,350,000 | 15,802,122 | 15,248,126 | 13,294,637 | 15,300,000 | 12,384,551 | 12,089,483 | 12,740,641 |
| කුලී | 29,264,000 | 24,603,277 | 25,239,861 | 20,280,675 | 22,576,000 | 22,544,981 | 19,830,187 | 20,917,259 |
| බලපත්‍ර ගාස්තු | 4,314,500 | 10,354,532 | 9,801,932 | 889,059 | 8,463,000 | 5,427,875 | 5,641,995 | 336,459 |
| වෙනත් ආදායම් | 15,473,000 | 11,815,334 | 11,852,035 | 812,192 | 17,494,000 | 12,741,299 | 13,200,373 | 848,893 |
| එකතුව | 64,401,500 | 62,575,265 | 62,141,954 | 35,276,563 | 63,833,000 | 53,098,706 | 50,762,038 | 34,843,252= |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් ඒකක 4889 කට අදාලව රු.12,316,720 ක හිඟ ශේෂයක් පැවතුණි. | ජංගම සේවා පැවැත්වීම, රතු නිවේදන යැවීම, ක්ෂේත්‍රයේ නියුතු නිලධාරීන් මඟින් වරිපනම් හිඟ අය කර ගැනීමට කටයුතු කර ඇති බව | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ආ) | කඩ කාමර 228 කින් අයවීමට තිබූ කඩ කුලිය රු.10,841,916 ක් වූ අතර එම හිඟ ශේෂය තුල වර්ෂ 02 ඉක්ම වූ කඩ කාමර 113 කින් අයවිය යුතු රු.4,250,021 ක ශේෂයක් විය. | ක්ෂේත්‍ර නිලධාරීන් යොදා ගනිමින් හිඟ කඩකුළී අය කර ගැනීම සඳහා කටයුතු කරන බව හා නීති කටයුතු සිදු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඇ) | සභාව සතු වෙළෙඳ සංකීර්ණ 2 කට අයත් කඩ කාමර 06 ක් ප්‍රයෝජනයට නොගෙන වසා දමා තිබුණි. | කඩකාමර අලුත්වැඩියා කටයුතු සිදු කිරීමෙන් පසු ටෙන්ඩර් කිරීමට නියමිත බව. | කඩ කාමර බදුදීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඈ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/ 2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 05 වන ඡේදය ප්‍රකාරව සභාව සතු කඩ කාමර 13 ක් සඳහා කඩහිමියන් සමඟ නෛතික ගිවිසුම් ගත වීමකින් තොරව බදු දී තිබුණ අතර එහි කාල පරාසය වසර 39 ත් වසර 05 ත් අතර විය. එසේම එළඹ ඇති ගිවිසුම වසර 03 කට වරක් යාවත්කාලීන කල යුතු වුව ද කඩ කාමර 77 ක ගිවිසුම් කාලය අවසන් වී මාස 04 ත් හා වසර 12 ත් අතර කාලයක් ගතවී තිබුණි. | දිගින් දිගටම ලිපි මඟින් දැනුවත් කිරීම් සිදුකර ඇති අතර, නීතිමය කටයුතු සිදු කරන බව හා ගිවිසුම් යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | උක්ත චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව සභාව සතු වෙළෙඳ සංකීර්ණ 03 කට අයත් කඩ කාමර 3 ක එක්වන් මුදල වූ රු.487,500 ක් අයකර ගෙන නොතිබුණ අතර 11 ඡේදය ප්‍රකාරව වෙනත් පාර්ශවයන් විසින් පරිහරණය කරන සභාව සතු වෙළෙඳ සංකීර්ණ 02 කට අයත් කඩ කාමර 04 ක ලේඛනගත බදුකරුවන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සභාවේ අවධානය යොමුවී නොතිබුණි. | එක්වන් මුදල් ලබා ගැනීමට දිගින් දිගටම ලිපි මඟින් දැනුවත් කිරීම් සිදු කර ඇති බව හා ඉදිරියේදී පවරා ගැනීමට හෝ නීතිමය කටයුතු සිදු කිරීමට නියමිත බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | කඩ කාමර 02 ක කඩ කුලී තක්සේරුව අවසන් වී වසර 16 ක කාලයක් ගතවී තිබුණද එය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | කඩ කාමර අලුත්වැඩියා කිරීමේ කටයුතු මේ වන විට සිදුවන අතර අලුත්වැඩියා කටයුතු අවසන් වූ පසු නව තක්සේරුව ලබා ගන්නා බව. | තක්සේරුව යාවත්කාලීනව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | වෙළෙඳ සංකීර්ණ 02 කට අයත් කඩ කාමර 10 ක් විවිධ හේතු නිසා භාවිතයට නොගෙන වසා දමා තිබුණ අතර ඉන් රු.1,306,860 ක හිඟ කඩ කුලියක් අය විය යුතුව පැවතුණි. | කඩ කාමර කිහිපයක් සභාව වෙත පවරාගෙන ඇති බවත්, අලුත්වැඩියා කටයුතු සිදු කිරීමෙන් පසු නැවත ටෙන්ඩර් කිරීමට මුදල් කාරක සභාව විසින් අනුමැතිය ලැබී ඇති බව | සභාව සතු සියළුම කඩ කාමර භාවිතයට ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය.

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම.

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අළෙවි කළ නොහැකි නොදිරන කසළ බැහැර කිරීම සඳහා සභාවට විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණ බැවින් ඒවා කොම්පෝස්ට් භූමියෙහිම පස් දමා වසා දමා තිබුණු අතර එක් රැස්වන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ද විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය කරන අතර අනෙකුත් කසළ විකිණීම සිදු කරන බවත්, ඉතිරි වන කසල සඳහා ඉදිරියේදී විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන බව. | විධිමත් කසල කළමණාකරන වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | කප්පරතොට, පාමන් ඒකල ඉඩමෙහි පවත්වාගෙන යනු ලබන කොම්පෝස්ට් ව්‍යාපෘතිය හා ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරිසර බලපත්‍රය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | කසල කළමණාකරන වැඩසටහන් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කළ යුතු රු.9,541,702 ක දායක මුදල් පියවීමට කටයුතු කර නොතිබුණි. | අදාල තහවුරු කිරීම් ලද පසු ඉතිරි ගෙවීම් කිරීමට ඉදිරියේදී කටයුතු සිදු කරන බව. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1993 වර්ෂයේදී සභාව වෙත පොදු කටයුතු සඳහා පවරා දී තිබූ රූඩ් 05 පර්චස් 04 ක බිම් කොටස යාබද ඉඩම්හිමියා විසින් වැට මායිම් ඉවත් කර පරිහරණය කරමින් තිබූ අතර වෙනත් පාර්ශවයක් විසින් මෙහි නිවසක් ද ඉදිකර තිබුණි. සභාව විසින් මෙම අනවසර පරිහරණය සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් මැන වැට මායිම් යොදා නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | සභාව සතු ඉඩම් නිරවුල් කර ගත යුතුය. |
| (ඇ) | 2002 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබූ පියවර පෙර පාසල් ව්‍යාපෘතිය යටතේ වැලිගම නගර සභා බලප්‍රදේශයේ සුනාමියෙන් අවතැන්වූ දරුවන්ගේ උන්නතිය සඳහා රු. මිලියන 06 ක මුදලක් වැය කර පන්ති කාමර 05 කින් හා වැසිකිළි 05 කින් සමන්විතව ළමුන් 100 දෙනෙකු සඳහා අධ්‍යාපනය ලබාදීමේ පහසුකම් සහිතව ජයවිකුම්ගම පෙර පාසල ආරම්භ කර තිබුණි. 2023 නොවැම්බර් 03 වන දින සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මෙම ගොඩනැඟිල්ලේ දොරවල් කැඩී ,වහළය අබලන් වී, ඇතුළත තෙමීමට ලක් වී බිත්තිවලට හානි සිදු වී තිබුණු අතර එහි කොටසක අනවසරයෙන් පිටස්තර පිරිසක් පදිංචි වී තිබුණි. මෙම පෙර පාසල් ගොඩනැඟිල්ලේ අවශ්‍ය පිළිසකර කිරීම් සිදු කර එය ආරක්ෂා කර ගැනීමට අවධානය යොමු වී නොතිබුණ අතර දීර්ඝ කාලයක් තිස්සේ අත හැර දමා විනාශ වීමට ඉඩහැර තිබුණි. | අනවසර පදිංචි කරුවන්ට ඉවත් වන ලෙස ලිඛිතව දැනුම් දී ඇති බවත් ඉවත් නොවුනහොත් ඉදිරියේදී නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | සභාව සතු දේපල ආරක්ෂා කරගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසි ඇතුළත් 2021 ජුලි 08 දිනැති අංක 2235/54 දරණ ගැසට් නිවේදනයේ 28 (1) වගන්තියේ විධිවිධාන වලින් බැහැරව ඉදිකල ගොඩනැගිලි 03 ක් සඳහා සංවර්ධන බලපත්‍ර ලබා ගෙන නොතිබුණු අතර ඉන් ගොඩනැගිලි 02 ක් සඳහා වාහන නැවතුම් සඳහා නියමිත | ලිපි මගින් දැනුවත් කර ඇති බවත් ඉදිරියේදී නිත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉඩකඩ වෙන් නොකර ඉදිකිරීම් සිදුකර තිබුණි. එසේම ඉහත නිවේදනය ප්‍රකාරව අළුතින් ඉදිකර තිබූ ගොඩනැගිලි 02 ක් සඳහා සංවර්ධන බලපත්‍ර ලබාගෙන තිබූ බවට තොරතුරු ඉදිරිපත් නොවුණ අතර මෙහිදී ගොඩනැගිලි සීමාවන් උල්ලංඝනය වන පරිදි ඉදිකිරීම් සිදුකර තිබුණි. | | |
| (ආ) | වැලිගම, කොහුණුගමුව පදිංචි පුද්ගලයකු විසින් වරිපනම් අංක 354/21 යන ස්ථානයේ වර්ග මීටර් 214.68 ක ප්‍රමාණයකින් යුතු තෙමහල් වාණිජ හා නේවාසික ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සංවර්ධන බලපත්‍රය නිකුත් කර තිබුණි. මෙම ගොඩනැගිල්ල පරීක්ෂාවේදී සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ මධ්‍යයේ සිට අඩි 50 ක සීමාව තුල ඉදිකිරීම කර තිබුණ ද ගොඩනැගිල්ලේ පිටුපස මායිම සිට ගොඩනැගිලි සීමාව තුල ඉදිකිරීම සිදු කර නොතිබුණි. තවද, තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදී තිබුණද හතරවන මහළ ඉදිකිරීම සඳහා ද කොන්ක්‍රීට් කණු ඉදිකර තිබුණි. | ලිපි මගින් අනවසර ඉදිකිරීම් විධිමත් කර ගැනීමට දැනුවත් කිරීම් සිදු කර ඇති අතර එසේ නොවුනහොත් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | පැළෑන වටරවුම ඉදිරිපස සිවු මහල් වාණිජ ගොඩනැගිල්ල සඳහා 2023 ඔක්තෝබර් 24 දින සංවර්ධන බලපත්‍රයක් නිකුත් කර තිබූ අතර 2023 නොවැම්බර් 03 දින නියැදි ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මහල් 4 කින් යුතු මීටර් 18.60x7.40 ක ප්‍රමාණයේ ගොඩනැගිල්ලක් ඉදි කර තිබුණි. 2023 ඔක්තෝබර් 24 වන දින සැලැස්ම අනුමත කරන අවස්ථාව වන විටත් අනුමැතියකින් තොරව මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබූ බව දක්නට ලැබුණි. අනුමත සැලැස්මේ වාහන නැවතුම් සඳහා වෙන් කර තිබූ බිම් කොටස ඇතුළත් කර අනුමත සැලැස්මට අනුකූල නොවන පරිදි මෙම ගොඩනැගිල්ල ඉදි කර තිබුණි. | ක්ෂේත්‍ර පරීෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පිළිබඳව 2024 පෙබරවාරි 08 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති අතර, නැවත සිහිකැඳවීම් ලිපියක් නිකුත් කිරීමට කටයුතු කරන බව. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය/පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සංගමයේ වාර්ෂිකව පවත්වනු ලබන සම්මේලනය සඳහා වැලිගම නගර සභාවේ කළමනාකරණ සේවා නිලධාරීන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීම වෙනුවෙන් ඉකුත් හා සමාලෝචිත වර්ෂයන්හිදී කුලී පදනම මත ලබාගත් බස්රථ සඳහා රු.406,400 ක මුදලක් සභා අරමුදලින් වැයකර තිබුණි. ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන මගින් මෙවැනි ගෙවීම් සඳහා කිසිදු නෛතික ප්‍රතිපාදනයක් සලසා නොතිබියදීත් මේ ආකාරයෙන් වෘත්තීය සමිති සම්මේලන සඳහා නිලධාරීන්ට සහභාගීවීමට ප්‍රවාහන පහසුකම් | ආණ්ඩුකාරවරගේ හා ප්‍රධාන ලේකම්තුමාගේ අනුමැතිය සහිත ලිපිය අනුව කටයුතු කළ බව. | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සැලසීම වෙනුවෙන් පෞද්ගලික පර්ශවයන් වෙත සභා අරමුදලින් ගෙවීම් කිරීම නෛතික ගෙවීමක් නොවන බව නිරීක්ෂණය කෙරේ. | | |
| (ආ) | සභාවේ සේවයට වාර්ථා නොකල කළමනාකරණ සේවා නිලධාරිනියක් වෙත මුදල් රෙගුලාසි 237 න් බැහැරව සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි හා මාර්තු මාසයන් වෙනුවෙන් රු.93,880 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. එම නිලධාරිනිය සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විටත් සේවයට වාර්ථා කර නොතිබුණු අතර රු.286,224 ක වැටුප් හා ආපදා ණය ශේෂයක් අය කර ගැනීමට ද තිබුණි. | අය විය යුතු වැටුප් හා ආපදා ණය ශේෂය අදාළ නිලධාරිනියගෙන් අය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව හා අදාල ගෙවීම් පැහැර හරින්නේ නම් නෛතික ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයේදී කොහුණුගම, දෙනියවත්ත අංක 59/1 යන ස්ථානයේ මාර්ගය අවහිර වනසේ ඉදිකර තිබූ තාප්පයක් කඩා ඉවත් කිරීමට එරෙහිව සභාවේ තාක්ෂණ නිලධාරිණියට විරුද්ධව තෙවන පාර්ශවයක් විසින් පවරා තිබූ නඩුවෙන් නිලධාරිණියට අවාසිදායක තීරණයක් ලබාදී තිබූ අතර ඒ වෙනුවෙන් සභා අරමුදලින් රු.71,200 ක නීතිඥ ගාස්තු ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් නිලධාරිණිය විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණද ඒ පිළිබඳව විස්තර සභාව සතුව නොතිබුණි. | දෙපාර්ශවය අතර පෞද්ගලික නඩුවක් ලෙස පැවැත්වෙන බැවින් නගර සභාව වෙත වර්තමාන තත්වය පිළිබඳව වෙනත් තොරතුරක් නොමැති බව. | ලිපිලේඛන ගොනු යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

### 3.5 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කප්පරතොට පාමන් ඒකල ඉඩමෙහි පවත්වාගෙන යනු ලබන කොම්පෝස්ට් අංගනයෙහි ඉදිකර ඇති භූගත ජීවවායු ඒකකය වර්තමානය වන විට අක්‍රීය තත්ත්වයේ පැවතුණ අතර මෙම ජීවවායු ඒකකය පිළිබඳ කිසිදු තොරතුරක් සභාව සතුව නොපැවතුණි. | ජීව වායු ඒකකය නැවත අලුත්වැඩියා කොට සක්‍රීය කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන පිළිබඳව ශක්‍යතා වාර්තාවක් සකස් කර ඉන් පසු අදාළ ක්‍රියාමාර්ග ගන්නා බව. | කඩිනමින් අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වැලිගම නගර සභාව සතු දේපළ 04 ක් කිසිදු ඵලදායී කාර්යයක් සඳහා යොදා නොගෙන නඩත්තු කිරීමකින් තොරව නිශ්කාර්යව පැවතීමෙන් මෙම දේපළ විනාශ වෙමින් පැවතුණි. | අලුත්වැඩියාවන් සිදු කිරීමට කටයුතු කරන බව. | කඩිනමින් අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2012 වර්ෂයේදී සභාව සතු කොම්පෝස්ට් ව්‍යාපෘති භූමියේ කොටසක ඉදිකර පවත්වා ගෙන ගොස් තිබූ රන් පොහොණිය අළෙවිසැල භූමියෙහි පවතින විවිධ වත්කම් ඒකක 16ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන පවතින අතර | භාවිතයට නොගන්නා වත්කම් ඉදිරියේදී ඵලදායීව භාවිතයට යොදා | සභාව සතු වත්කම් නිසි පරිදි නඩත්තු කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | එම භූමිය වල්බිහිවී එම ඉදිකිරීම් විනාශ වීමට ලක්වී තිබුණි. තවද, වර්ගමීටර් 136.56 ක් වූ දෙමහල් ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කර භාවිතයට ගැනීමට කටයුතු කර හා දැනට අබලන් තත්ත්වයට පත්වී ඇති රන්පොහොණිය අළෙවිසැල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ලද අලුත්වැඩියා කර අළෙවි කටයුතු වැඩි කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොතිබුණි. | ගැනීමට කටයුතු කරන බව. | |
| (ඇ) | සභාව සතු වටිනාකම රු.24,700,000 ක් වූ වාහන හා යන්ත්‍රෝපකරණ 04 ක් සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් අළුත්වැඩියා කිරීමට හෝ 2018 මැයි 22 දිනැති SS/03/12/05 දරන දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | ට්‍රැක්ටර් රථ 2 අලුත්වැඩියාවන් සිදු කිරීමට නියමිත බව, වයිබ්‍රේටි රෝල හා මෝටර් ග්‍රේඩරය වෙනත් සභාවක් වෙත ලබාදීමට හෝ හුවමාරු කර ගැනීමට ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැලිගම නගර සභාවේ සේවයේ නියුතු ප්‍රාථමික ශ්‍රේණියේ කම්කරුවන් 11 දෙනෙකු සඳහා තනතුරට අදාළ නියමිත රාජකාරි පැවරීමකින් තොරව වෙනත් රාජකාරි පවරා තිබූ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.5,065,950 ක මුදලක් වැය කර තිබුණි. බඳවා ගෙන තිබූ කම්කරුවන් සඳහා අදාළ නියමිත රාජකාරි පැවරීමක් සිදු නොකිරීම හේතුවෙන් මහජන සුභසාධනය, සෞඛ්‍ය කටයුතු හා මාර්ග නඩත්තු කටයුතු නියමිත පරිදි සිදු කිරීමට නොහැකි වන අතර බඳවා ගත් අරමුණ ඉෂ්ඨ කර ගැනීමට නොහැකිව ඇති බවද නිරීක්ෂණය වේ. | සේවා අවශ්‍යතාවය මත රාජකාරි පැවරීම් සිදු කර ඇති බව. | තනතුරට අදාල රාජකාරී පැවරීම් කළ යුතුය. |